රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2008(VI)

මගේ අංකය : EST-6/05/TPR/1020
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.12.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම

ඉහත කරුණට අදාළව නිකුත් කර ඇති 2019.05.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008(V) කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයේ 02(අ) ඡේදය, 2022 අයවැය යෝජනා අනුව පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

"02 (අ) - පෙට්‍රල්/ ඩීසල් වාහන භාවිතා කරන, අනුයුක්ත කළ නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට පහත පරිදි මාසික ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ."

| හිමිකම් ලබන නිලධරයන් | මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය | ඉන්ධන සඳහා අනුමත උපරිම මාසික දීමනාව |
|---|---|---|
| අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් සහ දිස්ත්‍රික් ලේකම්/දිසාපති පළාත් ප්‍රධාන ලේකම් | 220 | මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය X මාසයේ පළමු දිනට පවතින ඉන්ධන මිළ |
| අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් | 165 | |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධරයන් | 135 | |
| ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | 115 | |

02. මෙම සංශෝධන 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008(V) හි සඳහන් අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක වේ.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතුව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය